සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# දෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2017
# Second Term Test - Grade 7 - 2017

නම : ............................................... **කතෝලික ධර්මය** කාලය : පැය 02 යි.

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) ජේසුස් වහන්සේට ප්‍රථම ශ්‍රාවකයින් හමු වූ ස්ථානය වන්නේ,

(i) ගලිල මුහුද අසලදී ය. (ii) ජෙරුසලමේදී ය.
(iii) සීනයි කඳු මුදුන අසල ය. (iv) නායිම් නුවරදී ය.

(2) සෙබදිගේ පුතුන් දෙදෙනා වන්නේ,

(i) ජාකොබ් හා පේදුරු ය. (ii) ජාකොබ් හා ජොහාන් ය.
(iii) ජොහාන් හා ඇන්ඩෘ ය. (iv) ජොහාන් හා පේදුරු ය.

(3) ජේසුස් වහන්සේ ශු.මතෙව් තුමාව කැඳවන විට එතුමා සිටි ස්ථානය නම්,

(i) දාදු පොළේදී ය. (ii) ඉරිදා පොළේදී ය.
(iii) දුම්රිය පොළේදී ය. (iv) රේගු පොළේදී ය.

(4) ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයෙකු වූ ජුදාස් වෙනුවට තෝරා ගත් අපෝස්තුළුවරයා නම්,

(i) ජාකොබ් ය. (ii) ජුවාම් ය.
(iii) මතියස් ය. (iv) තෝමස් ය.

(5) ප්‍රසාද ස්නාපනයේදී භාවිතා කරනු ලබන්නේ,

(i) කරිෂ්මා තෛලයයි. (ii) ක්‍රිෂ්මා තෛලයයි.
(iii) ඔලිව් තෛලයයි. (iv) පූර්ව තෛලයයි.

(6) පූජකවරුන්ගේ මංගල්‍යය ලෙස නම් කර ඇත්තේ,

(i) මහ බ්‍රහස්පතින්දා ය. (ii) මහ සිකුරාදා ය.
(iii) ශොබ් ඉරිදා ය. (iv) පාස්කු ඉරිදා ය.

(7) ඥානගෝපාලයන් ලෙස හඳුන්වනු ලබන්නේ,

(i) අන්නවිරාළ ය. (ii) ගිහි නායකයින් ය.
(iii) පූජා ප්‍රසාදීන් වහන්සේලා ය. (iv) තේවාචාර්යවරු ය.

(8) කිතුණු විවාහයේ ලක්ෂණයක් වන්නේ,

(i) සාධාරණත්වයයි. (ii) ශුද්ධත්වයයි.
(iii) අපෝස්තලිකත්වයයි. (iv) ඒකත්වයයි.

(9) දවන යාග පූජාවක් කිරීම පිණිස ආබ්‍රහම්තුමා ඊසාක් රැගෙන ................................................ ගියේය.

(i) මොරියා දේශයට (ii) මිසර දේශයට
(iii) ජෙරුසලම් දේශයට (iv) ගලීල දේශයට

(10) ''එලීෂා ළඟට .......................... දිවැසිවරයා ගොස් සිය සළුව ඔහු පිට හෙළීය.'' හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න.

(i) ජෙරමියා (ii) එසකියෙල්
(iii) එලීයා (iv) යෙසායා

V **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න සඳහා සුදුසු පිළිතුර වරහනින් තෝරා හිස්තැන් පුරවන්න.**

(ශාරීරික, අධ්‍යාත්මික, හොසියා, දිව්‍ය සංරක්ෂණය, ජෙරමියා, ජාකොබ්)

(11) ........................................................... දිවැසිවරයාගේ නමේ අර්ථය ''දෙවියන් වහන්සේ උසස් කළ සේක.'' යන්න ය.

(12) දෙවියන් වහන්සේ තුළ අපගේ ජීවිතය සුරක්ෂිත වීම ............................................... යනුවෙන් හැඳින්වේ.

(13) මනස්ථාපනය තුළින් දෙවියන් වහන්සේගේ කරුණාවට ජනතාව යොමු කළේ .................................................. දිවැසිවරයා ය.

(14) ඔහු තම අතින් ඒසව්ගේ විලුඹ අල්ලාගෙන සිටියේය. එබැවින් ඔහුට ..................................................... යන නම දෙන ලදී.

(15) පෙනුයෙල්හි දර්ශනය මගින් ජාකොබ් තුමා තුළ ඇති වූ ................................................ පොර බැදීමක් ගැන කියැවේ.

V **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවල දැක්වෙන වගන්ති හරි නම් (3) ලකුණ ද වැරදි නම් (8) ලකුණ ද යොදන්න.**

(16) "සොරකම් නොකරව" දස පණතේ 8 වන පනත වේ. (    )

(17) කුරුස ගසේ හුන් ජේසු තුමා තම මව වූ මරියතුමිය භාර කලේ ශු.ජොහාන් තුමාට ය. (    )

(18) පූජකවරය නොමැති දේව ප්‍රසාද නිධානය ලැබුවෝ නිල පූජකවරු වෙති. (    )

(19) පැවිදි පූජකවරු රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා යටතේ රදගුරු පදවිය තුළ සේවය කරති. (    )

(20) ඊසාක් තුමා තුළ තිබූ යහපත් ගුණාංගයක් වන්නේ ඉවසීමයි. (    )

## II කොටස

**V පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**

(1) (i) ජුසේවාස් පියතුමා සිදුකළ ප්‍රාතිහාර්ය දෙකක් නම් කරන්න.

(ii) ජුසේවාස් මුනිතුමාව ශුද්ධවරයට ඔසවන ලද දිනය හා ශුද්ධවරයට එස වූ ශුද්ධෝත්තම පියතුමාගේ නම සඳහන් කරන්න.

(iii) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පැවිදි පූජක නිකායන් දෙකක් නම් කරන්න.

(iv) කතෝලික පූජා ප්‍රසාදීන් වහන්සේලා බෙදෙන කොටස් දෙක නම් කරන්න.

(v) ආබ්‍රහම්තුමාගේ කැඳවීමේ අංග දෙක සඳහන් කරන්න.

(vi) ආදිපිතෘ ජාකෝබ් තුමා දුටු දර්ශන දෙක මොනවා ද?

(vii) පූජකවරය නැමැති සක්‍රමේන්තුව දානය කරන්නේ කවුරුන් විසින් ද?

(viii) ආරම්භක දේව ප්‍රසාද නිධාන දෙකක් ලියන්න.

(ix) ප්‍රධාන දිවැසිවරු දෙදෙනෙක් නම් කරන්න.

(x) කිතුනුවකු ලෙස ඔබ තුළ වර්ධනය කරගත යුතු ගුණාංග දෙකක් ලියන්න. (ලකුණු 2 x 10 - 20)

(2) (i) ඉශ්‍රායෙල් දිවැසිවරු බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

(ii) ඉශ්‍රායෙල් සුළු දිවැසිවරු තිදෙනෙක් නම් කරන්න.

(iii) ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ දිවැසිවරයෙකු වූ ඔබට පාසල තුළ පැවරෙන වගකීම් 5ක් ලියා දක්වන්න.

(ලකුණු 2 + 3+5 - 10 )

(3) (i) ආබ්‍රහම්තුමා කැඳවීම භාර ගැනීමේදී එතුමාට පරිත්‍යාග කිරීමට සිදුවූ දේවල් දෙකක් නම් කරන්න.

(ii) ආදි පිතෘවරු තිදෙනෙකු නම් කරන්න.

(iii) ආබ්‍රහම්තුමාගේ කැඳවීම තුළින් ගත හැකි ආදර්ශ පහක් සඳහන් කරන්න.

(ලකුණු 2 + 3+5 - 10 )

(4) (i) හත්වන පනතට අනුව අප විසින් නොකළ යුතු දේවල් දෙකක් සඳහන් කරන්න.

(ii) හත්වන පනතට අනුව සාධාරණ ලෙස වස්තුව රැස්කර ගන්නා ක්‍රම තුනක් සඳහන් කරන්න.

(iii) " බොරු සාක්ෂි නොකියව" යන දේව පනත ආරක්ෂා කිරීමට ඔබට කළ හැකි දේවල් පහක් ලියන්න.

(ලකුණු 2 + 3+5 - 10)

(5) (i) පැවිදි පූජකවරුන්ට ලබා දෙන පූජක පොරොන්දු දෙක ලියන්න.

(ii) පැවිදි පූජකවරුන් ලබා ගන්නා වේදහාර ත්‍රිත්වය නම් කරන්න.

(iii) මීසම තුළ තේවාචාරිවරයෙකුට පැවරෙන වගකීම් පහක් සඳහන් කරන්න.

(ලකුණු 2 + 3+5 - 10)

(6) (i) පොදු පූජකවරුන්ට පැවරෙන වගකිම් ඉටු කිරීමට ඔබට සහය වන කතෝලික සමිති සමාගම් දෙකක් සඳහන් කරන්න.

(ii) දරුවන්ගෙන් දෙමව්පියන්ට ඉටු විය යුතු වගකීම් තුනක් ලියන්න.

(iii) දෙමව්පියන්ගෙන් දරුවන්ට ඉටු විය යුතු යුතුකම් පහක් ලියන්න.

(ලකුණු 2 + 3+5 - 10)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 7 - 2017

### කතෝලික ධර්මය පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | |
|---|---|---|---|---|
| 1. - (i) | | 6. - (i) | | |
| 2. - (ii) | | 7. - (iii) | | |
| 3. - (iv) | | 8. - (iv) | | |
| 4. - (iii) | | 9. - (i) | | |
| 5. - (ii) | | 10. - (iii) | | |

(ලකුණු 10 x 2 )

11 - ජෙරමියා

12. - දිව්‍ය සංරක්ෂණය

13. - හොසියා

14. - ජාකොබ්

15. - අධ්‍යාත්මික

( ලකුණු 5 x 2 )

16 සිට 20 දක්වා

16. - 5

17. - 4

18. - 4

19. - 5

20. - 4

( ලකුණු 5 x 2 )

### II කොටස

1. (i) - තනි අලියෙකු මෙල්ල කිරීම
   - දූදුරු ඔයෙන් එතෙර වීම
   - මහනුවරට වර්ෂාව ලබා දීම

   (ii) 2015 ජනවාරි 14

   (iii) නිර්මල මරිය නිකාය, ජේසු නිකාය, සිල්වෙස්ත්‍රෝ බෙනදිකානු නිකාය, දිව්‍ය සත්ප්‍රසාදීය නිකාය, ක්ලැරේෂියානු නිකාය

   (iv) පදවි පූජක, පැවිදි පූජක

   (v) පරිත්‍යාගය, අභියෝගය

   (vi) බෙතෙල් හි දර්ශනය / පෙනුයෙල්හි දර්ශනය

   (vii) රදගුරුතුමා

   (viii) ප්‍රසාද ස්නාපනය / දිව්‍ය සත්ප්‍රසාදය / අභිවෘද්ධි ආලේපය

   (ix) ජෙරමියා, යෙසායා, එසකියෙල්

   (x) ඉවසීම/ අන් මත ගරු කිරීම / සවන් දීම වගකීම් දැරීම / කැපවීම

2. (i) දේශක දිවැසිවරු, ලේඛක දිවැසිවරු

   (ii) හොසියා, නාහුම්, ජෝවෙල්, හබක්කුක්, ආමොස්, සෙපනියා, ඔබදියා, හග්ගායි, ජෝනා, සෙකරියා, මීකා, මලාකි

   (iii) සිසුවා ලියා ඇති කරුණු අනුව ලකුණු දෙන්න. ( ලකුණු 2 + 3+ 5 - 10)

3. (i) තමාගේ මව්බිම
   නෑදයන්
   පියාගේ ගෘහය

   (ii) ආබ්‍රහම්
   ඊසාක්
   ජාකොබ්

(iii) දෙවියන් වහන්සේට සේවය කිරීම
නිරතුරු යාච්ඤා කිරීම
ජීවිත වෙනසක් ඇති කර ගැනීම
කැඳවීමට අවනත වීම
දේව වචනය පිළිගැනීම

(ලකුණු 2 + 3+ 5 - 10)

4. (i) සොරකම් කිරීම
බලහත්කාරයෙන් ගැනීම
අසාධාරණයෙන් ගැනීම
අන්සතු දේපල විනාශ කිරීම

(ii) අවංකව වැඩ කිරිමෙන්
කැපවීමෙන් හා වෙහෙස මහන්සියෙන්
මිලයට ගැනීමෙන්
හුවමාරු කර ගැනීමෙන්
උරුමයක් ලෙස

(iii) සිසුන් ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න.

5. (i) කීකරුකම
පූජක බඹසර

(ii) කීකරුකම
ව්‍රත ශුද්ධිය
දිළිඳුකම

(iii) සුවිශේෂ කියවීම හා ධර්මානුශාසනය
වත්පිළිවෙත්වලට අනුව ප්‍රසාද ස්නාපනය
දානය කිරීම
දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය ලබා දීම
ආශිර්වාදකාර බන්ධන පිළිවෙත සිදු කිරීම
අවමගුල් පිළිවෙත් පැවැත්වීම
රදගුරුවරුන්ට හා පූජකවරුන්ට සහාය වීම (ලකුණු 2 + 3+ 5 - 10)

6. (i) ධර්මදූත ළමා සමාජය
පූජා උදව් සමිතිය
ළ.ක්‍රි.වි
ගීතිකා කණ්ඩායම

(ii) දෙමව්පියන්ට ගරු කිරීම හා කීකරු වීම
දෙමව්පියන්ගේ වැඩවලට උදව් වීම
වියපත් වූ දෙමව්පියන්ට සැලකීම
තම බාල සොහොයුරන් රැක බලා ගැනීම
හොඳින් අධ්‍යාපනය ලබා ගැනීම

(iii) දරුවන්ට අවශ්‍යය රැකවරණය, මග පෙන්වීම, පෝෂණය ලබා දීම
නියමිත වයසේදී ප්‍රසාද නිධාන ලබා දීම
දරුවන් කතෝලික විශ්වාසයට අනුව ඇති දැඩි කිරීම
දරුවන්ට පූර්ණ අධ්‍යාපනය ලබා දීම
කතෝලික ධර්මය විෂයක් ලෙස උගන්වන පාසල්වලට දරුවන් ඇතුළත් කිරීම
තම වගකීම් නිසි ආකාරව ඉටු කරන දරුවන් ලෙස ඔවුන්ව ඇති දැඩි කිරීම
යහපත් පුරවැසියෙකු ලෙස ජීවත් විය හැකි ලෙස දරුවාව හදා ගැනීම

(ලකුණු 2 + 3+ 5 - 10)